# ACCOUNTING



DILEEPA DENIYEGEDARA

# ලාභ අරමුණුකර නොගත් සංවිධාන Non-Profit Organization

ලාභ ලැබීමේ පරමාර්ථයෙන් තොරව විවිධ සමාජ සුභසාදන කටයුතු සඳහා පවත්වාගෙන යනු ලබන සංවිධාන ලාභ අරමුණුකර නොගත් සංවිධාන ලෙස සැලකේ

නිදසුන්

- අවමංගල්‍යාධාර සමිති
- ක්‍රීඩා සමාජ
- ළමා සමාජ

## ලාභ අරමුණුකර නොගත් සංවිධානවල ගිණුම් තැබීමේ අවශ්‍යතාවය

- සංවිධානයේ එදිනදා වියදම් පියවා ගැණීමට ප්‍රමාණවත් ආදායමක් උපයා ගැණීමට
- සංවිධානයට අරමුදල් ලද ආකාරය සහ එම අරමුදල් යෙදවූ ආකාරය බිඳිරිපත් කිරීම සඳහා

ලාභ අරමුණුකර නොගත් සංවිධානයක් පිළියෙල කරන ගිණුම්

1 ලැබීම් හා ගෙවීම් ගිණුම
2 ආදායම් හා වියදම් ගිණුම
3 මූල්‍යතත්ව ප්‍රකාෂය
4 විශේෂ ව්‍යාපෘති ගිණුම

## ලැබීම් හා ගෙවීම් ගිණුම

කාලච්චේදයේ සියළු මුදල් ලැබීම් හා ගෙවීම් සාරාංශ කරමින් කාලච්චේදයේ මුදල් ශේෂය ගණනය කිරීමේ පරමාර්ථයෙන් පිළියෙල කරන ගිණුම ලැබීම් හා ගෙවීම් ගිණුම ලෙස සැලකේ කාලච්චේදය අවසාන මුදල් ශේෂය ගණනය කිරීමේ පරමාර්ථයෙන් මුදල් ගිණුමක් පිළියෙල කෙරේ

ලැබීම් හා ගෙවීම් ගිණුම සහ මුදල් ගිණුම අතර සමානකම්

- මුදල් පදනම භාවිතා කරමින් පිළියෙළ කරයි
- කාලච්චේදය අවසාන මුදල් ශේෂය ගණනය කිරීමේ පරමාර්ථයෙන් මුදල් ගිණුමක් පිළියෙල කෙරේ
- මුදල් ගිණුම මෙන්ම ලැබීම් හා ගෙවීම් ගිණුම පිළියෙල කිරීම සඳහා වත්කම් පිළිබඳ මූලධර්මය භාවිතා කරයි

DILEEPA DENIYEGEDARA

ලැබීම් හා ගෙවීම් ගිණුම සහ මුදල් ගිණුම අතර වෙනස්කම්

| ලැබීම් හා ගෙවීම් ගිණුම | මුදල් ගිණුම |
|---|---|
| මුදල් ලැබීම හා ගෙවීම් සාරාංශගතව සටහන් කරයි | මුදල් ලැබීම හා ගෙවීම් දෛනිකව සටහන් කරයි |
| මුදල් හා බැංක ගිණුම් වෙන වෙනම පවත්වා නොගනී | මුදල් හා බැංක ගිණුම් වෙන වෙනම පවත්වා ගනී |
| කාලච්ඡේදය අවසානයේදී පිළියෙල කරයි | දෛනිකව නඩත්ත කරයි |
| මූල්‍යප්‍රකාශයකි | ලෙජර් ගිණුමකි |

## ආදායම් හා වියදම් ගිණුම

කාලච්ඡේදයට අදාල ආදායම බැර කරමින් සහ කාලච්ඡේදයට අදාල වියදම හර කරමින් කාලච්ඡේදයට අදාල අතිරික්තය හෝ ඌණතාවය ගණනය කිරීම සඳහා පිළියෙල කරන ගිණුම / ප්‍රකාශයයි

කාලච්ඡේදයට අදාල අතිරික්තය හෝ ඌණතාවය ගණනය කිරීමේ අරමුනින් මෙය පිළියෙල කිරීමේ අරමුනයි

ආදායම් හා වියදම් ගිණුම සහ ලැබීම් හා ගෙවීම් ගිණුම අතර වෙනස්කම්

| ආදායම් වියදම් ගිණුම | ලැබීම් හා ගෙවීම් ගිණුම |
|---|---|
| උපචිත පදනම මත පිළියෙල කරයි | මුදල් පදනම මත පිළියෙල කරයි |
| පරමාර්ථය අතිරික්තය හෝ ඌණතාවය ගණනය කිරීමයි | පරමාර්ථය මුදල් හා බංක ශේෂය ගණනය කිරීමයි |
| ආදායම් ප්‍රකාෂයට සමානය | මුදල් ගිණුමට සමානය |
| අයභාර ආදායම සහ වියදම පමණක් ඇතලත් කරයි | අයභාර මෙන්ම ප්‍රාග්ධන අයිතමයන්ද ඇතලත් කරයි |

## විශේෂ ව්‍යාපෘති ගිණුම

ලාභ අරමුණුකර නොගත් සංවිධාන තම අරමුදල් තර කර ගැණීම සඳහා විශේෂ ව්‍යාපෘතිවල නිරත වේ එම ව්‍යාපෘතියට අදාල ලාභය හෝ අලාභය ගණනය කිරීම සඳහා විශේෂ ව්‍යාපෘති ගිණුම පවත්වාගනී

DILEEPA DENIYEGEDARA

## සාමාජික මුදල්

ලාභ අරමුණුකර නොගත් සංවිධානවල ප්‍රධාන ආදායම් මාර්ගය වන සාමාජික මුදල් යම් නිස්චිත කාලච්චේදයකට වරක් අයකරගනු ලබන යම් නිස්චිත මුදලකි

සාමාජින මුදල් අයකල හැකි ආකාර

සංවිදානයක සමාජික මුදල් අයකලහැකි ආකාර කිහිපයකි

1 යම් නිස්චිත කාලච්චේදයකට වරක් යම් මුදලක් අයකිරීම
2 ජීවිත කාලයටම බලපැවැත්වෙන පරිදි යම් මුදලක් අයකිරීම (යාවජීව සාමාජික මුදල් )

යාවජීව සාමාජික මුදල් ගිණුම්ගතකල හැකි ආකාර

ප්‍රධාන ආකාර 02 කි

01 කාලච්චේදය තල ලද යාවජීව සාමාජික මුදල එම කාලච්චේදයේ ආදායමක් ලෙස හදුනා ගැණීම
02 ප්‍රථමයෙන් යාවජීව සාමාජජික මුදල් ගිණුමකට මාරුකර තීරනයකරගත් ප්‍රමාණය ආදායමක් ලෙස හදූනාගැණීම

✓ කාලච්චේදය තල ලද යාවජීව සාමාජික මුදල් ලැබීම

ලැබිම් හා ගෙවීම් ගිණුම හර

යාවජීව සාමාජික මුදල් බැර

✓ යාවජීව සාමාජික මුදල් ගිණුමේ ශේෂය ආදායමක් ලෙස සැලකීම

යාවජීව සාමාජික මුදල් හර

ආදයම් ප්‍රකාෂය බැර

කාලච්චේදය අවසාන යාවජීව සාමාජික මුදල් ගිනුමේ ශේෂය ජංගම නොවන වගකීමක් ලෙස මුලායතත්ව ප්‍රකාශය තුල දැක්විය යුතුය

DILEEPA DENIYEGEDARA

## ඇතුලත්වීමේ ගාස්තු

සංගමයට සාමාජිකයන් අළුතින් බඳවා ගැණීමේදී එක්වරක් පමණක් අයකරගනු ලබන ගාස්තුව මින් අදහස්වේ

ඇතුත්වීමේ ගාස්තු ගිණුම්ගතකල හැකි විකල්ප ක්‍රම

1 කාලච්ඡේදය තුල ලද මුළු ප්‍රමාණය ආදායමක් ලෙස සැලකීම
2 සමුච්චිත අරමුදලේ ඍජු වැඩිවීමක් ලෙස සලකා සමුච්චිත අරමුදලට බැර කිරීම
3 ප්‍රථමයෙන් ඇතුලත්වීමේ ගාස්තු ගිණුමට මාරුකර පසුව තීරණය කරගත් ප්‍රමාණය ආදායම් ලෙස සැලකීම

## පරිත්‍යාග

1 සංගමය විසින් ලබාදෙ පරිත්‍යාග

මෙම පරිත්‍යාග කාලච්ඡේදයට අදාල වියදමක් ලෙෂ හදුනාගනී

පරිත්‍යාග ගිණුම හර
    ලැබිම් ගෙවීම බැර

2 සංගමයට ලැබෙන පරිත්‍යාග

- <u>සාමාන්‍ය පරිත්‍යාග</u>

✐ පරිත්‍යාග ලැබීම

ලැබිම්/ හා ගෙවීම් හර
    ලද පරිත්‍යාග බැර

✐ සාමාන්‍ය පරිත්‍යාග ගිණුමේ ශේෂය ආදායම් වියදම් ගිණුමට මාරු කිරීම

ලද පරිත්‍යාග හර
    ආදායම් වියදම් බැර

DILEEPA DENIYEGEDARA

- <u>විශේෂිත පරිත්‍යාග</u>

**සංගමයට යම් විශේෂ අරමුනක් සදහා ලැබෙන පරිත්‍යාග විශේෂ පරිත්‍යාග ලෙස හැදින්වේ**

- **විශේෂ පරිත්‍යාග මුදලින් ලැබීම**

| | |
|---|---|
| ලැබිම් හා ගෙවීම් | හර |
|     අදාල අරමුදල් | බැර |

- **අදාල වත්කම අත්පත්කර ගැණීමට හෝ ඉදිකිරීමට මුදල් යෙදවීම**

| | |
|---|---|
| අදාල වත්කම් ගිණුම | හර |
|     ලැබිම් හා ගෙවීම් | බැර |

- **කාලච්චේදය තුල දී වත්කම් අත්පත්කර ගැණීමට හෝ ඉදිකිරීමට දරන ලද මුදල් ප්‍රමාණය සමුච්චිත අරමුදලට මාරු කිරීම**

| | |
|---|---|
| අදාල අරමුදල් ගිණුම | හර |
|     සමුච්චිත අරමුදල | බැර |

DILEEPA DENIYEGEDARA

# අසම්පූර්ණ වාර්ථා *Single Entry Accounts*

ව්‍යාපාරයක ජනප්‍රියම ගිණුම් තැබීමේ ක්‍රමය ද්විත්ව සටහන් ක්‍රමයයි මෙසේ ද්විත්ව සටහන් ක්‍රමයෙන් බැහැරව පවත්වාගන්නා වාර්ථා අසම්පූර්ණ වාර්ථා ලෙස හැදින්වේ

අසම්පූර්ණ වාර්ථාපවත්වා ගැණීමට හේතු

- ද්විත්ව සටහන් ක්‍රමය පිළිබඳ අවබෝධයක් නොමතිවීම
- ද්විත්ව සටහන් ක්‍රමයමත ගිණුම් තැබීමට උනන්දුවක් නොදැක්වීම
- ද්විත්ව සටහන් ක්‍රමයමත ගිණුම් තැබීම සදහා යම් දැනඅමක් අවශ්‍යවීම

## අසම්පූර්ණ වාර්ථා පවත්වා ගැණීමේ අවාසි

- ගිණුම්තැබීමේ නිරවද්‍යතාවය පරීක්ෂාකල නොහැකිවීම
- ගිණුම්කරණ තොරතුරුවල විශ්වාසවන්තබාවය අඩුවීම
- විගණනය අපහසුවීම

## අසම්පූර්ණ වාර්ථා ඇසුරින් මෙහෙයුම් ප්‍රතිඵලය ගණනය කිරීම

අසම්පූර්ණ වාර්ථා ඇසුරින් මෙහෙයුම් ප්‍රතිඵලය ගණනය කිරීම සදහා ක්‍රම 02 භාවිතා කරයි

01 ලාභ සමීකරණ මගින් මෙහෙයුම් ප්‍රතිඵලය ගණනය කිරීම

| ශුද්ධ ලාභය = අවසාන ශුද්ධ වත්කම් - ආරම්භක ශුද්ධ වත්කම් + ගැණිලි – අමතර ප්‍රාග්ධනය |
|---|

ඉහත සමීකරණය මගින් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය ගණනය කල හැකිය

02 විස්තරාත්මක මූල්‍ය ප්‍රකාෂ කට්ටලයක් පිළියෙල කිරීම මගින්

මෙහිදී ව්‍යාපාරය විසින්

- ආදායම් ප්‍රකාෂය
- මූල්‍ය තත්ව ප්‍රකෂය පිළියෙල කිරීම සිදුකරයි

*For classes* 071 5664774

071 2616609

DILEEPA DENIYEGEDARA